4 ඒකකය - ජලයේ කාර්ය(1)

✓ **පෙළ පොත හෝ වෙනත් සුදුසු ඉගෙනුම් සම්පත් පරිශීලනයෙන් පහත ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න. අවශ්‍ය තැන්හි දී වැඩිහිටියෙකුගේ සහය ලබා ගන්න.**

ක්‍රියාකාරකම 4.1

විවිධ ද්‍රව්‍ය ජලයේ දියවන ආකාරය පිළිබඳ සොයා බැලීමට පහත ක්‍රියාකාරකමෙහි නිරත වෙමු.

වගුවෙහි සඳහන් ද්‍රව්‍ය සමාන ප්‍රමාණය බැගින් ගන්න. වෙන වෙන ම පරීක්ෂා නළවලට දමා 5 ml පමණ වූ ජල ප්‍රමාණයක දිය කරන්න. දිය වීම සම්බන්ධයෙන් නිරීක්ෂණ පහත ආකාර වගුවක සටහන් කරන්න.

ද්‍රව්‍යය	නිරීක්ෂණ
සුදු සීනි	දමන ලද සීනි කැට නොපෙනී යයි. සෑදෙන ද්‍රාවණය අවර්ණ ය.
ග්ලූකෝස්	
කොන්ඩිස් කැට	
ශල්‍ය ස්ප්‍රිතු	
පොල් තෙල්	
නිල් කුඩු	
ඉටි	
භූමිතෙල්	
ලුණු	
විනාකිරි	
කහ කුඩු	
කපුරු බෝල	
ආප්ප සෝඩා	

පැවරුම 4.1

- වාතය (ඔක්සිජන්) බුබුලනය කරනු ලබන මාළු ටැංකියක වායු සැපයුම ඇති විට මත්ස්‍යයින් වැඩිපුර ගැවසෙන ස්ථාන මොනවාදැයි සොයා බලා වාර්තා කරන්න.
- වායු සැපයුම නතර කොට ටික වේලාවක් තැබූ විට මත්ස්‍යයින් වැඩිපුර ගැවසෙන ස්ථාන මොනවාදැයි සොයා බලා වාර්තා කරන්න.